## සභාවන් අතර සාමයිකත්වය (**DECREE ON ECUMENISM – *UNITATIS REDINTEGRATIO***) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝගයඃ ඉතිහාසය අධ්‍යයන ගවේෂණයක්

කේ. අයි. සෙව්වන්දි

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් ඉදිරිපත් කරනු ලැබූ **සාමයිකත්වය පිළිබඳ නියෝගය** සකස් වූ ආකාරය හා එය සකස්වීමට පසුබිම් වූ ඉතිහාස කරුණු පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අභිමතාර්ථය විය.

මෙම පර්යේෂණ මාතෘකාව අධ්‍යයනය කිරීමේ දී හමු වූ ප්‍රධාන පර්යේෂණ ගැටලුව නම් සභාව තුළ අන්තර්ගත වනුයේ සභා උපතක් ද නැතහොත් දේව උපතක් ද යන්න යි.

මෙම ගැටලුව නිරාකරණය කිරීමේ දී බයිබලීය චින්තනයට අනුව බලන කල ක්‍රිස්තුන් වහන්සේ ගොඩනගනු ලැබූ සභාවේ ඒකත්වය, ශුද්ධත්වය, විශ්වීය බව හා අපෝස්තලිකත්වය කැපී පෙනෙන ලක්ෂණ වේ. එම සංඝය සැමවිට ම කිතු සමිඳුන් හා බැඳුණු ජනතාවක් වන අතර එම ජනතාව එක ම දෙවියන් වහන්සේ විසින් කැඳවනු ලැබ ඇති අතර එක ම ස්වාමීන් වහන්සේට අයිති වන එක ම ප්‍රාණය ලබා ගත් පුද්ගලයෝ වෙති. ක්‍රිස්තුන් වහන්සේ තුළ ස්ථාපිත වූ එක ම සභාව බෙදීමට ලක් වූ අතර එම සභාවේ ඒකත්වයක් නැවත ඇති කර දේව උපතින් ගොඩනැගුණු සභාව නැවතත් පණ ගැන්වීමට උත්සාහ කර ඇති බව මෙම අධ්‍යයනයෙන් නිර්ණය කළ හැකිය.

මෙම අධ්‍යයනයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් වේ. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පදඃ** ඒකත්වය, සභාව, දෙවන වතිකාන මන්ත්‍රණ සභාව